**නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය**
**வீடமைப்பு மற்றும் சமுர்த்தி அமைச்சு**
**Ministry of Housing and Samurdhi**

# දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
# வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
# Department of Divineguma Development

4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல
4th floor, Sethsiripaya ,Battaramulla

මගේ අංකය / எனது இல / My No: DDD/HO/13/මැති.වක්‍ර-201
ඔබේ අංකය / உமது இல / Your No: ........................................
දිනය / திகதி / Date: 2015.07.09

සියළුම දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**පාර්ලිමේන්තු මහ මැතිවරණය - 2015**

**රජයට සහ රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අයත් දේපල පාර්ලිමේන්තු මහ මැතිවරණ කාල සීමව තුළදී අනිසි ලෙස භාවිතා කිරීම වැලැක්වීම සහ පාර්ලිමේන්තු මහ මැතිවරණ කාල සීමාව තුළ දී නිලධාරින්, සේවකයින් බඳවා ගැනීම / උසස් කිරීම/ මාරු කිරීම සීමා කිරීම හා අත්හිටුවීම.**

උක්ත කරුණ සම්බන්ධයෙන් මගේ සමාංක හා 2015.07.07 දිනැති ලිපියට වැඩිමනක් වශයෙනි

02. මෙම කරුණ සම්බන්ධයෙන් නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශයේ ලේකම් විසින් ඉදිරිපත් කර ඇති MHS/RD/AD/02/04 අංක දරණ 2015.07.08 දිනැති ලිපියේ පිටපතක් මේ සමඟ අමුණා එවමි.

03. උක්ත චක්‍රලේඛවල සඳහන් කර ඇති කරුණු පිළිබඳ කාරුණික අවධානය යොමු කරන ලෙස දක්වන අතර, මෙම දෙපාර්තමේන්තුව යටතේ සේවය කරන දිස්ත්‍රික මට්ටමේ, ප්‍රාදේශීය මට්ටමේ,බැංකු වල හා ග්‍රාමීය මට්ටමේ, මාණ්ඩලික නිලධාරීන්, දිවිනැගුම කළමනාකරුවන්, දිවිනැගුම සංවර්ධන නිලධාරින්, එම චක්‍රලේඛ ප්‍රකාරවම කටයුතු කිරීමට අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම් ලබා දෙමින් මෙම නිලධාරින්ට භාහිර පාර්ශව වෙතින් මැතිවරණ නීති උල්ලංඝණය කලායැයි චෝදනා නොවීමට වග බලා ගන්නා ලෙස කාරුණිකව ඉල්ලමි.

04. මේ වන විටත් දිවිනැගුම සවංර්ධන දෙපාර්තමේන්තුව යටතේ සිටින ඇතැම් නිලධාරින් සම්බන්ධයෙන් විවිධ පාර්ශව වෙතින් මොවුන් ඍජුවම යම් පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට පක්ෂපාතීත්වය දරමින් දේශපාලන කටයුතු වල නිරතවන බවට පැමිණිලි ලැබී ඇති බැවින් ඉහත මාගේ සමාංක හා 2015.07.07 දිනැති ලිපිය සමඟ ඉදිරිපත් කළ මැතිවරණ කොමසාරිස්ගේ PE/2015/04 අංක දරණ 2015.06.29 දිනැති චක්‍රලේඛයේ සඳහන් සියළු උපදෙස් අකුරටම පිළිපදින ලෙසත් මේ චක්‍රලේඛ උල්ලංඝණය කරන නිලධාරින්ට විරුද්ධව දැඩි විනය ක්‍රියා මාර්ග ගැනීම සඳහා මා වෙත දන්වන ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

ධම්මික ගුණවර්ධන,
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ).

**පිටපත්:-**

1. ජනාධිපති ලේකම් - කාරු.දැ.ගැ.ස.
2. අග්‍රාමාත්‍ය ලේකම් - කාරු.දැ.ගැ.ස.
3. ආමාත්‍යාංශ ලේකම්, නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය - කාරු.දැ.ගැ.ස.
4. මැතිවරණ කොමසාරිස් - කාරු.දැ.ගැ.ස.

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / மேலதிக பணிப்பாளர்தலைமையதிபதி / Additional Director General
අධ්‍යක්ෂ (පාලන) / பணிப்பாளர் (நிர்வாகம்) / Director (Administration)
ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant
කාර්යාලය / அலுவலகம் / Office